සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 අනිකුත් සමාන ව්‍යාපාර හා සැසඳීමේ දී නිලූෂිකාගේ ව්‍යාපාරය සාර්ථක වීමට බලපා ඇත්තේ ඇයගේ මුල්‍ය ශක්තිය බව පැවසිය හැකිය. නිලූෂිකාගේ මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වයට බලපෑ හේතුව හැඳින්විය හැක්කේ,

(1) අවස්ථාවකි. (2) තර්ජනයකි. (3) ශක්තියකි. (4) දුර්වලතාවයකි.

02 මූලික තෘප්තියක් ඉටුකර ගැනීම සඳහා මිනිසා තුළ ඇති පෙළීමේ ස්වභාවය හඳුන්වනුයේ,

(1) නිෂ්පාදනයයි. (2) අවශ්‍යතාවකි. (3) වුවමනාවකි. (4) පරිභෝජනයයි.

03 භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවැති දුර්වලතාවයක් වනුයේ,

(1) ගෙනයාමේ පහසුව (2) කල්පසු වූ ණය ගෙවීමට නොහැකි වීම

(3) ද්වික සමපාතයක් වීම (4) වටිනාකම මැනීමේ මිනුමක් වීම

04 ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ ජාතික නිෂ්පාදනය වර්ගීකරණය කළ ආකාරයට සේවා නිෂ්පාදනයට පමණක් අදාළ වන කාණ්ඩය වනුයේ,

(1) බැංකු රක්ෂණ, තොග වෙළඳාම, ප්‍රවාහනය, ගබඩාකරණය, නිවාස අයිතිය

(2) ප්‍රවාහනය, ගබඩාකරණය, කෘෂිකර්මාන්තය, තොග හා සිල්ලර වෙළඳාම

(3) බැංකු රක්සණ, තොග හා සිල්ලර වෙළඳාම, දැව කර්මාන්තය

(4) බැංකු රක්ෂණ, කෘෂි හා ධීවර ගබඩාකරණය, ප්‍රවාහනය

05 ලෝක වෙළඳපලෙහි ඛණිජ තෙල් මිල පහළයෑම මත ප්‍රවාහන ගාස්තු කිලෝමීටරයකට සත 50 කින් අඩුකිරීමට හැකි බව ප්‍රවාහන සමිති හිමිකරුවන් දන්වා සිටී. මෙම හේතුව ව්‍යාපාරයකට බලපාන

(1) දේශපාලන පරිසරයට අයත් වේ. (2) තාක්ෂණික පරිසරයට අයත් වේ.

(3) ආර්ථික පරිසරයට අයත් වේ. (4) සමාජ හා සංස්කෘතික පරිසරයට අයත් වේ.

06 ව්‍යාපාර විකාශනය විවිධ අධියර යටතේ සාකච්ඡා කෙරේ. මෙම විකාශනයේ මුල්ම අධියර හඳුන්වනු ලබන්නේ,

(1) මුදල් භාවිතය ලෙසය. (2) භාණ්ඩ හුවමාරුව ලෙසය.

(3) විද්‍යුත් වාණිජ්‍යය ලෙසය. (4) කාර්මික විප්ලවය ලෙසය.

07 වර්තමානයේ වෙළඳපොලෙන් භාණ්ඩ හා සේවා මිලට ගැනීමට හැකිවී ඇත්තේ,

(1) ඍජු නිෂ්පාදනය නිසාය. (2) වක්‍ර නිෂ්පාදනය නිසාය.

(3) ප්‍රාථමික නිෂ්පාදනය නිසාය. (4) භාණ්ඩ හුවමාරුව නිසාය.

08 භාණ්ඩ හා සේවාවක දැකිය හැකි පොදු ලක්ෂණයක් වනුයේ,

(1) සපයන්නාගෙන් වෙන්කළ හැකි වීමයි. (2) මිලක් ගෙවා ලබාගතයුතු වීමයි.

(3) අවශ්‍යතා ඉටුකර ගැනීමට යොදාගැනීමයි. (4) ගබඩාකර තබාගත හැකි වීමයි.

09 ඕනෑම ව්‍යාපාර සංවිධානයකට පොදු වූ ලක්ෂණයක් වනුයේ,

(1) නීතිමය පුද්ගලභාවය (2) සීමිත වගකීම

(3) අඛණ්ඩ පැවැත්ම (4) අරමුණු

10 ව්‍යාපාර පරිසරය සූක්ෂම හා සාර්ව වශයෙන් හෝ අභ්‍යන්තර හා බාහිර වශයෙන් හෝ බෙදා දැක්විය හැකිය. මෙම සූක්ෂම පරිසරයට අන්තර්ගත කළ හැකි සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ප්‍රජාව, සේවකයින්, ආර්ථික ප්‍රතිපත්ති

(2) කළමනාකරුවන්, සේවකයින්, ආර්ථික ප්‍රතිපත්ති

(3) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයින්

(4) ප්‍රජාව, අයිතිකරුවන්, දේශපාලන ප්‍රතිපත්ති

11 අලෙවි සැලැස්මක අන්තර්ගත කරුණු ඇතුළත් කාණ්ඩය වනුයේ,

(1) ඒකක මිල, ඒකක ගණන, විකුණුම් ආදායම

(2) අපේක්ෂිත ආදායම, අපේක්ෂිත වියදම, අපේක්ෂිත ලාභය

(3) ලැබූ ආදායම්, ගෙවූ වියදම්, අපේක්ෂිත ලාභය

(4) අලෙවි සැලැස්ම, මෙහෙයුම් සැලැස්ම, මූල්‍ය සැලැස්ම

12 ව්‍යාපාරයක සාර්ව නැතිනම් බාහිර පරිසර විශ්ලේෂණයෙන් හඳුනාගත හැකි වන්නේ,

(1) ශක්තීන් හා දුර්වලතාය (2) තර්ජන හා දුර්වලතාය

(3) අවස්ථා හා තර්ජනය (4) ශක්තීන් හා අවස්ථාය

13 විද්‍යුත් මුදල් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

(1) හරපත්, ණයපත්, ටෙලර් පත් (2) ණයපත්, පිළිපත්, හරපත්

(3) චෙක්පත්, හරපත්, ණයපත් (4) හරපත්, චෙක්පත්, පිළිපත්

14 චේතක ''නවීන විලාසිතාගාරය'' නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇත. මේ තුළින් චේතකට අත්වන වැදගත් ප්‍රතිලාභයක් වනුයේ,

(1) නෛතික පුද්ගලභාවයක් ලැබීමය.

(2) ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීමය.

(3) ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීමය.

(4) සියලු හිමිකම් අයිතිකරුට ලැබිය හැකි වීමය.

15 චේතක මහතාට මෙම ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට අවශ්‍ය වී ඇතිනම් ලියාපදිංචි කළ යුත්තේ කුමන පනතක් යටතේ ද?

(1) 1918 අංක 6 දරණ පනත යටතේය (2) 2007 අංක 7 දරණ පනත යටතේය

(3) 1890 පණත යටතේය (4) 1972 අංක 5 දරණ පනත යටතේය

16 ලියාපදිංචිය සඳහා අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක් අවශ්‍ය වන ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) සංස්ථාපිත සමාගම්ය (2) සමිති ව්‍යාපාරය

(3) සමුපකාර සමිතිය (4) හවුල් ව්‍යාපාරය

17 ලාභ අරමුණුකර නොගත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන ලෙස දැක්විය හැක්කේ,

(1) සංස්ථා හා සමිති සංවිධානය (2) සමුපකාර හා සමිති සංවිධානය

(3) සංස්ථා හා සමුපකාරය (4) සංස්ථා හා දෙපාර්තමේන්තුය

18 ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී රාජ්‍ය සමාගම් අයත් වනුයේ,

(1) ලාභ අරමුණු කරගත් පෞද්ගලික අංශයටය

(2) ලාභ අරමුණු කරගත් පොදු අංශයටය

(3) ලාභ අරමුණු කරගත් රාජ්‍ය අංශයටය

(4) ලාභ අරමුණු කර නොගත් පොදු අංශයටය

19 ව්‍යාපාරයක ජංගම නොවන වත්කම් යටතට වර්ග කළ නොහැකි වත්කමක් වනුයේ,

(1) උපකරණ (2) ගොඩනැගිලි (3) රථවාහන (4) බඩු තොගය

20 නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් කම්හල් පොදුකාර්ය පිරිවැය සමන්විත වනුයේ,

(1) වක්‍ර ද්‍රව්‍ය හා වක්‍ර ශ්‍රමයෙනි. (2) වක්‍ර ද්‍රව්‍ය හා ඍජු ශ්‍රමයෙනි.

(3) ප්‍රාථමික පිරිවැය නොවන පිරිවැයෙනි. (4) ඍජු ද්‍රව්‍ය හා ඍජු ශ්‍රමයෙනි.

21 චෙක්පතකින් යම් ගෙවීමක් කළවිට එය ගෙවූ බව සනාථ කිරීමට ව්‍යාපාරිකයා ළඟ ඇති මූලික ලියවිල්ල වනුයේ,

(1) ඉන්වොයිසියයි. (2) පිළිපතයි. (3) බැරපතයි. (4) හරපතයි.

22 සන්නිවේදන ක්‍රියාවලියක මූලිකාංග යටතේ ප්‍රතිචාරය ලෙස අදහස් වනුයේ කුමන පිළිතුරක් ද?

(1) අදාළ ග්‍රාහකයා පණිවිඩය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරයයි.

(2) යවන්නා විසින් සැපයෙන තොරතුරයි.

(3) පණිවිඩය යැවීම සඳහා යොදාගැනෙන ක්‍රමයයි.

(4) ග්‍රාහකයාගෙන් නිවේදකයා වෙත ලැබෙන ප්‍රතිචාරයයි.

23 රක්ෂිතයාට රක්ෂණ සමාගමෙන් හැර වෙනත් පාර්ශව වලින් වන්දි ලබාගැනීම වළක්වන රක්ෂණ මූලධර්මය වනුයේ,

(1) දායකත්වය (2) ආදේශනය (3) හානිපූරණය (4) උපරිම විශ්වාසය

24 ප්‍රවාහනයේ මූලිකාංග වඩාත් නිවැරදිව දැක්විය හැක්කේ,

(1) මාර්ගය, මාධ්‍ය, බලය හා පිරිවැය ලෙසය.

(2) බලය, මාර්ගය, ආරක්ෂාව හා පර්යන්තය ලෙසය.

(3) මාර්ගය, බලය, පිරිවැය හා ආරක්ෂාව ලෙසය.

(4) මාධ්‍ය, මාර්ගය, බලය හා නැවතුම්පොල ලෙසය

25 බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස අදහස් වනුයේ,

(1) බැංකුවක් ලෙස කටයුතු කිරීමට අවසරය ලත් බැංකුවක් බවයි.

(2) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ කටයුතු කරන බැංකුවක් බවයි.

(3) බැංකු අතර බැංකුවක් ලෙස කටයුතු කිරීමට අවසර ලැබූ බවයි.

(4) බැංකු ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගනුදෙනු කරුවන්ගෙන් අවසරය ලත් බැංකුවක් බවයි.

26 ගබඩාකරණයේ දී තොග පිළිබඳ වාර්තා තබාගැනීමට ගබඩා ලෙජරය හා බින්පත භාවිතා කරනු ලබයි. බින්පත සම්බන්ධයෙන් අදාළ වන පිළිතුර වනුයේ,

(1) ගබඩාවට ලැබෙන භාණ්ඩ සටහන් කරයි.

(2) ඉතිරි භාණ්ඩ ප්‍රමාණය හා වටිනාකම දක්වා කාර්යාල ලිපි ගොනුවේ දක්වයි.

(3) ඉතිරි භාණ්ඩ ප්‍රමාණය ඒකක වශයෙන් ගබඩා කර ඇති ස්ථානයේ ප්‍රදර්ශනය කරයි.

(4) ගබඩාවෙන් නිකුත් කළ භාණ්ඩ හා ඉතිරි භාණ්ඩ ප්‍රමාණය දක්වයි.

27 පහත සඳහන් ප්‍රකාශ අතුරින් ව්‍යාපාරික ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැකි වන්නේ කුමක් ද?

(1) රු. 50000/- වටිනා ලී බඩු ණයට ගත්තා

(2) ගෙවල් කුලී වශයෙන් රු. 2000/- ගෙව්වා

(3) ව්‍යාපාරයට බඳවාගත් නවක සේවකයිනට ගෙවිය යුතු වැටුප රු. 25000/- බව ඇස්තමේන්තු කරයි.

(4) ණය විකුණුම් පියවීමට රෝහණගෙන් චෙක්පතක් ලැබුනා රු. 1000/-

28 බැංකු ජංගම ගිණුමේ ශේෂය ඉක්මවා චෙක්පත් ලිවීමට ගනුදෙනුකරුට බැංකුව ලබාදෙන අවසරය හඳුන්වන්නේ,

(1) බැංකු අයිරාව (2) බැංකු ණය (3) බැංකු ප්‍රකාශය (4) බැංකු ශේෂය

29 ගිණුමක කාර්යභාරය ඉටුකරන මූලික සටහන් පොත වනුයේ,

(1) ගැනුම් ජ'නලය (2) මුදල් පොත (3) විකුණුම් ජ'නලය (4) පොදු ජ'නලය

30 ව්‍යාපාරයක් මුදල් වට්ටම් අඩුකරනු ලබන අවස්තාව වනුයේ,

(1) අත්පිට මුදලට බඩු ගන්නා අවස්ථාවේ දී

(2) බඩු මිලට ගන්නා අවස්ථාවේදීම මුදලින් ගෙවීම් කරන විට

(3) බඩු මිලට ගන්නා අවස්ථාවේ දී ම චෙක්පතින් ගෙවීම් කරන විට

(4) ණය ගෙවීමට ගිවිස ගත් කාලය තුළ ගෙවීම් කරන විට

31 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා කපිල ලී බඩු සමාගමෙන් රු. 50000 වටිනා ලි බඩු ණයට ගැනීම සටහන් කළ යුතු මූලික සටහන් පොත වනුයේ,

(1) මුදල් පොතයි. (2) පොදු ජ'නලයයි.

(3) ගැනුම් ජ'නලයයි. (4) විකුණුම් ජ'නලයයි.

32 2014 නොවැම්බර් සුළු මුදල් භාරකරුට දුන් අග්‍රිමය රු. 2500 කි. මාසය අවසානයේ වියදම රු. 1920 කි. ඉදිරි මාසයට අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු මුදල වනුයේ,

(1) රු. 1920 කි. (2) රු. 680 කි. (3) රු. 2500 කි. (4) රු. 4420 කි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | රු. 100000 | බඩු තොගය | රු. 25000 |
| උපකරණ | රු. 40000 | ණය හිමියෝ | රු. 20000 |
| බැංකු ණය | රු. 50000 | ණයගැතියෝ | රු. 22000 |

වශයෙන් ව්‍යාපාරයක් සතු වත්කම් හා වගකීම් පවතී.

33 මෙම ව්‍යාපාරයේ ඇති වත්කම් හා වගකීම්වල වටිනාකම නිවැරදිව පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) රු. 100000, රු. 157000 (2) රු. 187000, රු. 70000

(3) රු. 207000, රු. 50000 (4) රු. 217000, රු. 42000

34 ඉහත තොරතුරු සඳහන් ව්‍යාපාරයේ ප්‍රාග්ධනයේ වටිනාකම කොපමණ ද?

(1) රු. 257000 (2) රු. 187000 (3) රු. 117000 (4) රු. 70000

35 අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ගැනීමට අදාළ ද්විත්ව සටහන වනුයේ,

(1) ගැනිලි ගිණුම හර
    මුදල් ගිණුම බැර

(2) ප්‍රාග්ධන ගිණුම හර
    මුදල් ගණුම බැර

(3) ගැනිලි ගිණුම හර
    ප්‍රාග්ධන ගිණුම බැර

(4) මුදල් ගාණුම හර
    ගැනිලි ගිණුම බැර

36 විකුණුම් ජ'නලයේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් වනුයේ,

(1) විකුණුම් ගිණුම හර
    භාණ්ඩ ගැණුම්කරුවන්ගේ ගිණුම් බැර

(2) භාණ්ඩ ගැණුම්කරුවන්ගේ ගිණුම් හර
    විකුණුම් ගිණුම බැර

(3) විකුණුම් ගිණුම හර
    භාණ්ඩ විකුණුම්කරුවන්ගේ ගිණුම් බැර

(4) භාණ්ඩ විකුණුම්කරුවන්ගේ ගිණුම් හර
    විකුණුම් ගිණුම බැර

37 ත්‍රිත්ව තීරු මුදල් පොතක හර වට්ටම් තීරුවේ එකතුව ලෙජරයට පිටපත් වනුයේ,

(1) දුන් වට්ටම් ගිණුම හර මුදල් ගිණුම බැර වශයෙනි.

(2) ලද වට්ටම් ගිණුම හර මුදල් ගිණුම බැර වශයෙනි.

(3) දුන් වට්ටම් ගිනුම හර ණයගැති ගිණුම්වලට බැර වශයෙනි.

(4) දුන් වට්ටම් ගිණුම හර ලද වට්ටම් ගිණුම බැර වශයෙනි.

38 ව්‍යාපාරය ගයාන්ට විකුණන ලද භාණ්ඩ වලින් රු. 4000/- වටිනා භාණ්ඩ ආපසු හරවා එවන ලදී. මෙය සටහන් කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලේඛණය වනුයේ,

(1) ලදුපතයි (2) හරපතයි (3) බැරපතයි (4) වවුචරයයි

- ව්‍යාපාරයක පිළියෙල කළ මුදල් පොතෙහි බැංකු තීරුවේ ශේෂය රු. 5000 විය. එදිනට ලද බැංකු ප්‍රකාශයේ ශේෂය මෙයට වෙනස් වූ අතර වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය විය.

ස්ථාවර නියෝග රු. 2000 පැවති අතර බැංකු ගාස්තු වශයෙන් රු. 200 අයකර ඇත.

නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් වශයෙන් රු. 1500 ක් පැවති බව දක්නට ලැබුනි.

39 ඉහත තොරතුරු අනුව මුදල් පොතේ සංශෝධන ශේෂය වනුයේ,

(1) රු. 7200 කි. (2) රු. 5000 කි. (3) රු. 6800 කි. (4) රු. 2800 කි.

40 බැංකු සැසඳුම පිළියෙල කළ පසු ලැබෙන බැංකු ප්‍රකාශයේ ශේෂය වනුයේ,

(1 x 40 = 40)

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

11 ශ්‍රේණිය කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු වන කොටස අනිවාර්යය වේ. A කොටසින් ප්‍රශ්න 2 ක් ද, B කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

01 රංජිත් වසර කිහිපයක සිට නිමි ඇඳුම් අළෙවියෙහි නිරතව සිටී. තම පංතියේ සිටි මිතුරන් දෙදෙනකු වන හේමන්ත සහ මහින්ද හමුවන්නේ මේ අතරතුරේ දී ය. හේමන්ත පිටරට රැකියාවක නිරතව සිට පැමිණ ඇති අතර මහින්ද නිමි ඇඳුම් කලාව පිළිබඳ වසරක පාඨමාලාවක් හදාරා ඇති බව පවසයි. මෙම දෙදෙනාම රංජිත්ගේ ව්‍යාපාරයට හවුල්වීමට කැමැති බව ප්‍රකාශ කරන ලද අතර එම කැමැත්ත ලබාගැනීමට රංජිත් ද එකඟ වී ඇත.

මොවුන් බඳවාගන්නා අවස්ථාවේ දී රංජිත්ගේ ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් රු. 150000/- ද, වත්කම් ලෙස රු. 225000/- ද, වගකීම් වශයෙන් රු. 75000/- ද තිබී ඇත. මිතුරන් බඳවා ගැනීමෙන් පසු පහත සඳහන් ගනුදෙනු සිදුවී ඇත.

නව ප්‍රාග්ධනය යෙදුවා රු. 100000
නව ප්‍රදර්ශනාගාරයක් මිලට ගත්තා රු. 75000
රක්ෂණ බිල ගෙව්වා රු. 4000
පැමිණි සැපයුම්කරුවකු වන ශිවාගෙන් ණයට නිමි ඇඳුම් ගත්තා රු. 8000
වැටුප් ගෙව්වා රු. 9000
ප්‍රචාරණ වියදම් ගෙව්වා රු. 3000

(1) මිතුරන් බඳවා ගැනීමට පෙර රංජිත් පවත්වාගෙන ගිය ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධානයකට ද? එම ව්‍යාපාර සංවිධානය සම්බන්ධයෙන් දැකිය හැකි වාසි දෙකක් ලියන්න.

(2) රංජිත්ගේ ව්‍යාපාරයට හේමන්ත හා මහින්ද බඳවා ගන්නේ නම් ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් ලියන්න.

(3) රංජිත්ගේ ව්‍යාපාරයට හේමන්ත හා මහින්ද බඳවා ගැනීමෙන් අත්කර ගතහැකි ශක්තීන් දෙකක් ලියන්න.

(4) මෙම ව්‍යාපාර කරගෙන යැමේ දී එය ඉදිරියට කරගෙන යැමට උපකාරී විය හැකි උපකාරක සේවා දෙකක් ලියන්න.

(5) ඉදිරියේ දී මෙම ව්‍යාපාරය තවත් පුළුල් කිරීමට මුදල් අවශ්‍යතාවක් ඇතිවී මුදල් තැරැව්කාර ආයතනයක සහය පැතීමට අදහස් කරගෙන ඇතැයි සිතන්න. මෙම මුදල් තැරැව්කාර ආයතනයක් යනු කුමක්ද? හඳුන්වා දෙන්න.

(6) ඉහත සඳහන් ව්‍යාපාරයේ සිදුවී ඇති ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කළයුතු මූලාශ්‍ර ලේඛන දෙකක් සඳහන් කරන්න.

(7) ඉහත සඳහන් ගනුදෙනු සියල්ල සිදුවීමෙන් පසු ව්‍යාපාරයේ වත්කම්, ප්‍රාග්ධනය හා වගකීම් පවතින ආකාරය ගිණුම්කරණ සමීකරණය ඇසුරින් දක්වන්න.

(8) මුළු වත්කම්වල වැඩිවීම පළමුව පැවති වත්කම්වලට වඩා කොපමණකින් වැඩිවේ ද?

(9) එම වත්කම් අතරින් ජංගම නොවන වත්කම්වල වැඩිවීම කොපමණ ද?

(10) මෙම ව්‍යාපාරය ද්‍රව්‍ය ණයට සහ අත්පිට යන දෙයාකාරයටම විකිණීම සිදුකරන බැවින් ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරන මූලික සටහන් පොත් මොනවා ද? (2 x 10 = 20)

## A කොටස

02 (1) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවැති දුර්වලතා හතරක් ලියන්න.

(2) විවිධ ව්‍යාපාර සංවිධානවල පොදු ලක්ෂණ හතරක් ලියන්න.

(3) තනි පුද්ගල ව්‍යාපාරයක් හා සැසැඳීමේ දී හවුල් ව්‍යාපාරයක දැකිය හැකි වාසි දෙකක් ලියන්න.

(4) ව්‍යාපාරයකට පැවතිය හැකි බාහිර පරිසර සාධක හතරක් නම් කරන්න.

(5) ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභ හතරක් ලියන්න.

(2 x 5 = 10)

03 (1) ව්‍යාපාරයකට මානව සම්පත් අවශ්‍යතාව ඇතිවී සේවකයන් බඳවා ගැනීමට අදහස් කරන්නේ නම් සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

(2) නිෂ්පාදන ආයතනයකට නිෂ්පාදනයට වැයවූ නිෂ්පාදන පිරිවැය දැන සිටීමෙන් අත්කර ගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(3) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය යන්න හඳුන්වන්න. එය කුමන මූලිකාංගවලින් සමන්විත වේද? නම් කරන්න.

(4) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයකුට අත්කර ගත හැකි වාසි හතරක් සඳහන් කරන්න.

(5) වර්තමානයේ බහුල වශයෙන් ණය කාඩ්පත් භාවිතා කරනු දක්නට ලැබේ. ණය කාඩ්පත් භාවිතයෙන් ව්‍යාපාරිකයකුට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (2 x 5 = 10)

04 (1) රක්ෂණ මූලධර්ම දෙකක් සඳහන් කරන්න. රක්ෂණ කටයුතුවල නිරත ආයතන දෙකක් නම් කරන්න.

(2) ව්‍යාපාර කටයුතුවලට සන්නිවේදනය ඉතා වැදගත් වේ. එසේ වැදගත් වන හේතු දෙකක් සඳහන් කරන්න.

(3) උපකාරක සේවාවක් ලෙස ප්‍රවාහනය යන්න නිර්වචනය කර දක්වන්න.

(4) සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේ දී සලකා බලන සාධක හතරක් ලියන්න.

(5) ක්‍රමවත් ගබඩාකරණයක් නොවීමෙන් අත්විය හැකි ප්‍රතිඵල හතරක් ලියන්න. (2 x 5 = 10)

## B කොටස - ගිණුම්කරණය

05 (1) 2015 ජනවාරි 3 වන දින ජිනදාස රු. 100000 යොදා ව්‍යාපාරයක් ආරම්භ කර පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදුකර ඇත.

ජනවාරි 4 විකිණීම සඳහා රු. 40000 භාණ්ඩ අත්පිට මුදලට ගැනීම හා ජයවීරගෙන් එදිනම රු. 5000 භාණ්ඩ මිලට ගැනීම.

ජනවාරි 5 රු. 5000 ගෙවල් කුලී ගෙවීම

ජනවාරි 6 රු. 8000 භාණ්ඩ අත්පිට විකුණූ අතර ශාන්තට රු. 3000 භාණ්ඩ විකුණන ලදී.

ජනවාරි 7ජයවීරට රු. 2000 ගෙවූ අතර ශාන්තගෙන් රු. 3000 මුදල ලැබුණි.

ජනවාරි 7සේවක වැටුප් ගෙව්වා රු. 1000

2015 ජනවාරි 7 දින ජිනදාසගේ අත ඉතිරි මුදල් ශේෂය සෙවීමට මුදල් ගිණුමක් පිළියෙල කරන්න. ( ල . 05)

(2) බැංකු ප්‍රකාශය යන්න පැහැදිලි කර දක්වන්න. ( ල . 01)

(3) බැංකුවේ බැංකු ශේෂයත් මුදල් පොතේ බැංකු ශේෂයත් හා වෙනස්වීමට බලපාන හේතු හතරක් ලියන්න. (ල. 02)

(4) මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීමේ දී ඇතුළත් කරන අයිතම හතරක් ලියන්න. ( ල . 02)

06 කරුණාරත්න මහතාගේ ව්‍යාපාරයේ සුළු මුදල් වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2015 මාර්තු 01 දිනට සුළු මුදල් අත ඉතිරි මුදල රු. 350
එදිනට අග්‍රිමය ප්‍රතිපූරණය කළා රු. 2650
මාර්තු 02 ගමන් වියදම් ගෙවීම් වවුචර අංක 1 රු. 200
තැපැල් හා මුද්දර වවුචර අංක 2 රු. 150
විදුලි පණිවිඩ ගාස්තු වවුචර් අංක 3 රු. 200
මාර්තු 03 සංග්‍රහ වියදම් වවුචර් අංක 4 රු. 300
කුලී රථ ගාස්තු වවුචර් අංක 5 රු. 250
ගෙනඒමේ කුලී වවුචර් අංක 6 රු. 400
මාර්තු 04 තැපැල් හා මුද්දර වවුචර් අංක 7 රු. 150
මාර්තු 07 සංග්‍රහ වියදම් වවුචර් අංක 8 රු. 225

විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොත පිළියෙල කරන්න. (ල. 10)

07 (1) ආපසු එවුම් ජ'නලයෙන් තොරතුරු ලෙජරයට පිටපත් වන ආකාරය සඳහන් කරන්න. ( ල . 02)

(2) පොදු ජ'නලය භාවිතයට ගන්නා අවස්ථා හතරක් ලියන්න. ( ල . 02)